# පිරිවෙන් අධ්‍යාපනය හා දේශීය වෛද්‍ය ක්‍රමය

ආරියදාස කුමාරසිංහ මහතා

පිරිවෙන බෞද්ධ අධ්‍යාපන ආයතනය යි. එහි ප්‍රධාන විෂයට අදාළ විෂය වශයෙන් ප්‍රාචීන භාෂාශාස්ත්‍ර ද උගැන්වේ. මේ රටේ පිරිවෙනෙහි සංස්කෘත සිංහල භාෂා දෙක ද ආයුර්වේදය හෙවත් දේශීය වෛද්‍යක්‍රමය ද ඒ විෂය මාලාවට ඇතුළත් ය. භික්ෂූන් වහන්සේලාගේ සම්බන්ධතාව ඇති පිරිවෙන් අධ්‍යාපනයෙන් භාරතයේත්. ලංකාවේත්, ආයුර්වේදයට ඉටු වූ යහපත යළිත් සලසා ගැනීම ගැන සලකා බැලීම සඳහා අතීත තත්ත්වය සෝදිසි කිරීම මේ ලිපිය සැපයීමේ පරමාර්ථය යි.

ඒ ඒ රටෙහි හෙවත් දේශයෙහි සෞඛ්‍ය වෛද්‍ය ප්‍රශ්න යුගලය විසඳා ගැනීමෙහි අවුරුදු දහස් ගණනෙක කාලයක් මුළුල්ලේ ඉවහල් වූ වෛද්‍ය ක්‍රමයක් ඇතහොත් එය දේශීය වෛද්‍යක්‍රමය වශයෙන් සලකනු ලැබේ. මෙහි පවත්නේ පංචමහාභූත භූමිය මතුයෙහි ත්‍රිදෝෂවාදය පාදක කොට පැන නැගුණු වෛද්‍ය ක්‍රමයකි. ආයුර්වේදයේ මූලික ලක්ෂණය ද මෙයම යැ. ඇතැම් පරපුරු සතුව පැවත එන බෙහෙත් වට්ටෝරු ද ආයුර්වේදයේ උපදේශ පංතිය ඇසුරු කොට පිළියෙල වූ ඒවාය. ඒවා අමුතු වෛද්‍ය ක්‍රමයක් වශයෙන් වෙන් කළ නොහැක්කේ භාරතීය ආයුර්වේදයෙන් තොර වූ මූලධර්ම හෝ උපදේශ පද්ධතියක් හෝ ඒවායෙහි නොවන හෙයිනි.

ආයුර්වේදය යනු ආයුෂ ලබාගැනීමට ඉවහල් වන උත්තම ශාස්ත්‍රය යන අර්ථය ඇති වචනයෙකි. වේදය (උත්තම ශාස්ත්‍රය) යන කොටස එකතු කිරීමෙන් මේ ශාස්ත්‍රයේ ඇති අගය ආයුර්වේදයේ ආදි පුරුෂයන් විසින් හොඳින් සැලකිල්ලට භාජන කළ බව කිව හැකි ය. භාරතීය වෛද්‍ය ක්‍රමය යන වචනය නො යොද ආයුර්වේදය යන වචනය ම යෙදූවේ මෙය වෘත්ති විශේෂයක් වශයෙන් ක්‍රියාත්මක නොකිරීමේ උසස් අදහසක් තිබුණු බැවිනි. ආයුර්වේදයේ ආදි පුරුෂයෝ පරාර්ථකාමී වූ මුනිවර පිරිසකි. වනගත කුටිවල වෙසෙමින් අනුන්ගේ සිවුපසයෙන් යැපුණු මුනිවරු, ජනතාවට සේවයක් කිරීමේ හැකියාව ඇති රජකුමරුවන්ගෙන් ද, බමුණු පැටියන්ගෙන් ද තෝරා ගත් අය ශිෂ්‍යයන් වශයෙන් වෙන් කොට ගෙන උගන්වා වෛද්‍යවරයන් බවට පත් කිරීමට පටන් ගත්හ. එසේ වෙදදුනත් වූ ඕහු වෛද්‍ය සේවයෙහි නිරත ව වෙදකම රජකම තරමට උසස් කළහ.

ආයුර්වේදයේ මුල් අවදිය ක්‍රිතුවසින් අවුරුදු තුන්දහසකින් ඔබ්බෙහි යයි එක් පක්ෂයක් කියන අතර, මොහෙන්ජොදාරෝ සභ්‍යත්වය අනුව සලකා බලන තවත් පක්ෂයක් එය ක්‍රිතුවසින් අවුරුදු දස දහසකටත් වඩා පැරණි යයි කියති. කෙසේ වුව ලෝකයේ මුලින් ම පහළ වූ වෛද්‍ය ක්‍රමය ආයුර්වේදය යැ යන මතය පිළිගැනි හමාර ය.

අප දැන සිටින ආකාරය අනුව ආයුර්වේදය භාරතයේ හින්දු මුනිවරයන් ගේ සමාධිබුද්ධි ලතාවේ හටගත් අමෘත පුෂ්පයෙකි. ඒ මුනිවරයන්ගේ කාලය තුළ සිතින්

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

දරා ගැනීමක් මිස පොත්පත් ලිවීමේ වැඩ පිළිවෙළක් නොතිබිණි. වේදයට ශ්‍රැතිනාමය ලැබුණේ කනින් අසා දරා ගැනීමේ වැඩ පිළිවෙළට එය සම්බන්ධ වූ නිසා ය. වේද-භාෂාවෙන් පිළියෙළ වූ ආයුර්වේදය ද මේ දශාවේ පැවැතිණි. බුද්ධාගමටත් මේ ශ්‍රැති දශාව යොමු වී යයි අමුතුවෙන් කිය යුතු නැත. කෙසේ වුවද ආයුර්වේද-ඥයනුත් බුදු සසුනේ පැවිදි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ධර්මප්‍රචාරයෙහි යෙදුණු වෛද්‍යක භික්ෂුවරයන් නිසා දෙවන වරට භාරතයේ හැම අතෙහිත්, අසල පිහිටි රටවලත් බුද්ධ ධර්මය සමඟ ආයුර්වේදය ද පැතිරී ගිය බව සැලකේ. පළමුවාරය ඍෂියුගය යි, අගස්ති දකුණු ඉන්දියාවේ ද සෙසු මුනිවරු උතුරුකරේද, ආයුර්වේදය පැතිර වූහ.

භික්ෂුවරයෝ ගිය ගිය තැන පන්සල් පිහිටුවා ගත්හ. ඒවාට අනුබද්ධ කොට පිරිවෙන් ද තනා ගත් හ. මුල් අවධියේ සංඝාවාසය වූ පිරිවෙන පසු පසු වැ විද්‍යාස්ථානය විය. එහෙත් ඉන්දියාවේ ඉඩ ලැබුණේ පුරුෂ පක්ෂයට ය. ඒත් රජ බමුණු කුල දෙකේ අයට ය. රාජ කුලයේ කාන්තාවනට පමණක් ඉගෙනීමේ මඟ පිළියෙළ වී තිබිණ. ආයුර්වේදය පිළිබඳ තත්ත්වය ද මෙය මය. එහෙත් අතීතයේ කාන්තා පක්ෂයේ අය ආයුර්වේදය හදළ බවක් ඉතිහාසගතව නැත. සිය ගණන් ආයුර්වේද ග්‍රන්ථකාරයන් ගැන කරුණු කියන ඉතිහාසය කාන්තාවක කළ වෛද්‍ය ග්‍රන්ථයක් තිබුණු බවක් නොකියයි.

බුද්ධකාලයේ පැවැත්තේ වේද මූලික අධ්‍යාපන ක්‍රමයෙකි. ආයුර්වේදය පංචම වේදය විය. ත්‍රිපිටක අධ්‍යාපනයෙන් බෞද්ධ අධ්‍යාපන වැඩ පිළිවෙළ ආරම්භ වුව ද ජනෝපයෝගී භාෂා ශාස්ත්‍ර අධ්‍යාපනය වෙන් වී පැවැතිණ. මේ නිසා ම බෞද්ධ වැඩ පිළිවෙළ පැවිදි අංශයට සීමා විය. මහායාන වැඩ පිළිවෙළට සම්බන්ධ වූ භික්ෂූහු ද හින්දු පූජකයන් මෙන් ආයුර්වේදදිය හදරන්නට වූහ. ආයුර්වේද වැඩ පිළිවෙළත් ආගමික වැඩ පිළිවෙළක් බඳු විය. කනිෂ්ක රාජ සභායෙහි පළමු වැ ආයුර්වේද අමාත්‍ය ව සිටියේ චරකමුනිවරයා ය. ක්‍රි.පූ. 4 වන සියවසේ දී සංස්කෘතයට හැරීගිය අග්නිවේශ තන්ත්‍රය (ආයුර්වේදයේ මුල්පොත) කනිෂ්ක කාලය (1 සියවස) ළඟා වනු සමඟ ම ජරාජීර්ණ ව ගියේ ය. එය පිළිසකර කිරීමේ කාර්‍ය්‍යය බෞද්ධ චරකට පැවරිණ. ඉන් අග්නිවේශයේ මුල පටන් චිකිත්සා ස්ථානයේ පූර්වාර්ධයට සීමා වූ විශාල කොටසේ වැඩ සම්පූර්ණ කරද්දී අපවත් විය. ඉතිරි කොටසේ වැඩ නිමා වූයේ බෞද්ධ දෘඪබල අතිනි. එය සුළු කොටසකි. අග්නිවේශ තන්ත්‍රය මෙසේ යළිත් නැගී සිටිය ද අනාර්ෂ ප්‍රකාශනවල ආධිපත්‍යය අනුව මෙය චරක සංහිතා නාමයෙන් පළ කළ යුතු යයි උසස් ආයුර්වේදඥයෝ කියන්නට වූහ. චරක සංහිතාව පහළ වූ ආකාරය දැන් පැහැදිලි ය. චරකයට පසු පසුව භාරතීය දර්ශනවලට අයත් නොයෙක් කරුණු පිවිසළා තිබෙනු පෙනේ.

චරකයේ ප්‍රතිසංස්කරණය විමර්ශකයන් ගේ චර්චාවට පාත්‍ර වූ බව පෙරත් හැඟැ විණි. මේ වැඩ පිළිවෙළ ආදර්ශයට ගත් ආයුර්වේද ප්‍රේමීහු 1 වන සියවස වන විට ජරාජීර්ණ ව පැවැති සුශ්‍රැත සංහිතාවේ ප්‍රතිසංස්කරණය ගැන බෞද්ධ මහාදර්ශනික නාගාර්ජුන මුනිවරයාට කරුණු කී හ. මහායානිකයකු වූ එතුමාත් ආයුර්වේදය ද හදරා සිටියේ ය. බෞද්ධ අධ්‍යාපනයෙහි නිරත වූ එතුමා ශාස්ත්‍රානුකූල වැ සුශ්‍රැතය පිළිසැකැසී ය. එය නාගාර්ජුන සංහිතාව වශයෙන් ප්‍රචලිත නොවූයේ අනාර්ෂ වචන ප්‍රවේශයක් එහි නොවූ හෙයිනි. මෙසේ භාරතීය සංඝාවාසය (පරිවේණ ස්ථානය) නිසා ආයුර්වේදයේ මුල්පොත් දෙක ආරක්ෂා වී ය.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

3 වන සියවසෙහි විසූ නවනීත පඬිවරයාගේ නාවනීතක නමැති වෛද්‍ය ග්‍රන්ථය ධර්ම ප්‍රචාරක භික්ෂුවරයෙකු ගේ මාර්ගයෙන් භාරතයෙන් පිටමං ව තිබී, මෑතෙක නැගෙනහිර යුරෝපයේ දී හමුවී ආපසු ගෙන අවුත් සකස් කොට නවනාවනීතක නාමයෙන් ප්‍රකාශත්වයට පත් කොට ඇත.

3 වන සියවසේ අපරභාගයේ සින්ධුදේශයේ වැජඹුණු වාග්භට පඬිතුමා පිරිවෙනක උගත් බෞද්ධ වෛද්‍යපිතෘවරයෙකි. ආයුර්වේදයේ වෘධත්‍රයියේ (මුල්පොත් තුනේ) තුන් වැන්න (අෂ්ටාංග හෘදය) රචනා කළේ මෙතුමා විසිනි. ග්‍රන්ථයේ මංගලාචරණය සම්බුද්ධ ප්‍රණාමයෙන් සිදුකැර ඇත. එය ඇතුළත් පද්‍යය මෙසේ ය.

රාගාදිරෝගාන් සතතානුෂක්තා
නශේෂකාය ප්‍රසෘතානශේෂාන්,
ඖත්සුක්‍ය මෝහාරතිදාන් ජඝාන
යෝ 'පූර්වවෛද්‍යාය නමෝ'ස්තු තස්මෛ,

යමෙක් සියලු කල්හි ම ඇලී බැඳී සිටියාවූත්, මුළු මහත් සිරුරෙහි පැතිරී ගියාවූත්, උත්කණ්ඨා මෝහ අරති යන මේවා ගෙන දෙන්නාවූත්, -(බීජ සහිත) සියලු ම රාගාදී රෝගයන් නැසුවේ ද? ඒ අද්භූත වෛද්‍යවරයාට (බුදුරදුන්ට) නමස්කාර වේවා (වදිමි). යනු මෙහි අදහස යි. පිරිවෙන් අධ්‍යාපනයෙහි වැදගත්කම මෙහිද පිළිබිඹු වෙයි. පසු පසු වැ පහළ වූ බොහෝ බොදු පඬිවරු මේ පද්‍යයේ අර්ථය අනුහරණය කළ හ. අෂ්ටාංගහෘදය බෞද්ධලෝකය පුරා පැතිර ගත්තේ වාග්භට නාමයෙනි. මෙයට පිළියෙළ වූ ටීකාග්‍රන්ථ 34 කි. මෙතරම් ටීකාග්‍රන්ථ සංඛ්‍යාවක් පිරිවර කොටගත් වෙනත් ග්‍රන්ථයක් ඇත්දැයි සැක සහිත ය. විෂය සම්භාරයේ අගය අනුව නම් වෘධත්‍රයියෙහි ප්‍රමුඛත්වය හිමි විය යුත්තේ වාග්භටයට යි.

වාග්භට පඬිතුමා පළමුවෙන් ම කළේ අෂ්ටාංග සංග්‍රහය නමැති වෛද්‍ය ග්‍රන්ථය යි. එහිත් මංගලාචරණ පද්‍යය මුඛ ප්‍රණාමයෙන් ඉතාමත් චමත්කාරජනක ආකාරයෙන් විරචිත ව ඇත.

තෘෂ්ණාදීර්ඝසමසද්විකල්ප ශිරසං ප්‍රද්වේෂචංචත් ඵණං
කාමක්‍රෝධවිෂං විතර්කදශනං රාගප්‍රචණ්ඩේක්ෂණම්,
මෝහාස්‍යං ස්වශරීරකෝටරශයං චිත්තෝරගං දරුණං
ප්‍රඥමන්ත්‍රබලේනශඃ ශමිතවාන් බුද්ධාය තස්මෛ නමඃ,

යනු එයයි. මෙහි සිත නයකුට සමාන කොට බුදුරදුන් ඒ සිත්නයා නුවණ නමැති මන්ත්‍රබලයෙන් දමනය කළ සැටි නිරූපිත ය. මේ ග්‍රන්ථයෙහි ද බෞද්ධ අදහස් රාශියෙකි.

7—12 සියවස් කාලය ඉන්දියාවේ තන්ත්‍රසාහිත්‍ය අවදිය යි. බෞද්ධ හිමිවරුන් සිද්ධවෛද්‍ය සම්ප්‍රදය බිහි කළේ මේ අවධිය තුළ පැන නැගුණු සිද්ධාචාර්යවරයන් ගේ සහායත්වයෙනි. හින්දියේ සිද්ධකාව්‍ය යුගය (8 සියවස) දමේ ආචාර්යවරුන් ගෙන් ප්‍රභාස්වර විය. සිද්ධ වෛද්‍යවරයන් ගේ නායකත්වයෙහිරැඳුණේ සිද්ධනාගාර්ජුන භික්ෂුවරයා යි. නාලන්ද විශ්ව විද්‍යාලයේ ආයුර්වේදාංශයේ අධිපති ව සිටි මේ හිමි තෙමේ යෝගාරූඪ ව පාරදයෝග විද්‍යාව (සින්දූරම් වෙදකම) ද, නාඩි ශාස්ත්‍රයද

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

පහළ කළේ ය. මේ දෙක නිසා ආයුර්වේදය වේගයෙන් ඉදිරියට ඇදී ආ යැ. එනමුත් මුසලමාන හින්දු දෙපක්ෂයේ සාම්‍රාජ්‍යය නිසා ඉන්දියාවේ බෞද්ධතත්ත්වය පණ අදින තැනට පත්විය. බෞද්ධ ආයුර්වේද සම්බන්ධය විශ්ලිෂ්ට විය. ආයුර්වේදය ද ඇද වැටිණ.

ඈත අතීතයේ දී ශ්‍රී ලංකාව දකුණු දිග භූමිභාගයට සම්බන්ධ ව තිබිණ. දරුණු මූදුකැළඹෙකින් මේ සම්බන්ධය නැතිව ගියේ ය. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් විය. මේ වෙන්වීමට පෙර භාරතයේ සෙසු පෙදෙස්වල මෙන් මැ මේ භාරත ඛණ්ඩයෙහි ද විවිධ ජාතිවලට අයත් භාරතීයයෝ විසූහ. සුමේරියන්වරුන් දකුණු ඉන්දියාවට සංක්‍රමණය වූයේ මීට හුහ කලකට පසුව යි. එහෙයින් වෙන්ව ගත් අපේ රටේ මුල් අවස්ථාව සමඟ ද්‍රවිඩ ජනතාවගේ සම්බන්ධයක් සිදු වී නැත. වෙන් වූ මේ භූමිභාගයෙහි විසූ උගතුන් අතර ආගම, ධර්ම, දර්ශන, විද්‍යා, කලා ශිල්පාදිය දරාගත් අය සිටින්නට ඇත. එසේ ම ආයුර්වේදඥයෝත් වූහයි නොකිය හැකි ද? මේ අනුව විජයාගමනයට පෙරත් ආයුර්වේදය මෙහි දේශීය වෛද්‍යක්‍රමය වී පැවැති බව පිළිගත හැකි ය. කෙසේ වුවද විජයාගමනයෙන් භාරතීය වැඩ පිළිවෙළ තව තවත් පරිපුෂ්ට වැ ක්‍රියාත්මක වන්නට ඇත. මේ තත්ත්වය වඩාත් උද්දීපනය වූයේ දෙවන පෑ තිස් රජුගේ අවදියේ ඇති වූ බෞද්ධ සම්බන්ධය උඩ ය.

මෙහිත් මහාවිහාරය තුළ සංඝාවාසය (පිරිවෙන) ඇති විය. පසුවැ පිරිවෙන භික්ෂූන් ගේ ආධිපත්‍යය ඇති ශාස්ත්‍රශාලාව බවට පෙරැළිණ. එහෙත් අධ්‍යාපනයෙහි පැවැත්තේ භාරතයේ පැවැති තත්ත්වය ම ය.

කුඹුරේ හේනේ වැඩට යන ගොවිරාළට අකුරු ඉගෙනීමේ වුවමනාවක් නො වී ය. කුල වශයෙන් බෙදී ගිය ජනතාව තම කුලයට අයත් වෘත්තීය ඇසුරු කැර ජීවත් වූහ. ඔවුන්ට ද අකුරු වුවමනා නො වී ය. භික්ෂූන්ට අමතර වැ රාජකීයයෝ, රජයේ නිලදරුවෝ, ආයුර්වේද ශිෂ්‍යයෝ, ජ්‍යෝතිෂ ශිෂ්‍යයෝ යනාදීහු පිරිවෙන්වල උගත්හ. ගුරු ගෙදරවල් ඇති වූයේ උපැවිදි වූ උගතුන් ගෙනි.

ක්‍රි·පූ. 3 — 4 ශතකයන් අතර බරණැස විසූ උගතුන් ගේ නැණ ගැබින් සංස්කෘත භාෂාව එළියට ආ යැ. එතෙක් වෛදික භාෂාවෙන් රචිත වැ පැවැති වෛද්‍ය ග්‍රන්ථයන් මෙන් මැ සෙසු ග්‍රන්ථවර්ග ද සංස්කෘතයට හැරී ජනෝපයෝගිත්වයට පත් විය. සංස්කෘත එකලැ ඉන්දියාවේ ශාස්ත්‍රීය භාෂාව වශයෙන් පිළිගැනී තිබිණ. එය මේ රටට බල පෑ කරුණක් විය. ලංකාවේ පළමු වන ආයුර්වේද ග්‍රන්ථය වශයෙන් පිළිගැනෙන 'සාරාර්ථ සංග්‍රහය' සංස්කෘතයෙන් ලිවීමට බුද්ධදාස රජතුමා පෙළඹුණේ මේ නිසයි.

ලංකාධිපති රාවණ රාජයා අතින් සකු බසින් ලියැවුණු සේ සමහරුන් සලකන අර්ක ප්‍රකාශ, නාඩි ප්‍රකාශ, කුමාරතන්ත්‍ර යන කුඩා වෙදපොත් තුන 18 වන සියවස තුළ භාරතයේ විසූ රාවණ නමැත්තකු විසින් ලියන ලදැයි භාරතීය විචාරකයන් සලකනුයේ, බුදුවසින් හවුරුදු විසි දහසකටත් පෙර විසූ හ යි පවසන රාවණ රජු සෙමෙහි සංස්කෘත භාෂාවක් නොපැවැති නිසයි. කිතුවසින් 7 වන සියවස එළඹ ගන්නා තුරම [illegible] වෛද්‍ය ක්‍රමයේත් නාඩි ශාස්ත්‍රයේත් අර්කක්‍රමයේත් ඡායාමාත්‍රයක් වත් චරකාදි ග්‍රන්ථවලට පවා නොවැටුණු බව පෙරත් කියා ඇත. 11 වන සියවස තුළ වඟුරටේ [illegible] චරකයට ටීකාවක් ලියූ චක්‍රපාණි පඬිවරයා චක්‍රදත්ත නමැති සිය වෛද්‍යග්‍රන්ථය රචනා කරමින් රසශාස්ත්‍රය සිහිපත් කැර ඇත්තේ —

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

(නාගාර්ජුනෝ මුනීන්ද්‍රඃ — ශශාස යල්ලෝහ ශාස්ත්‍රමතිගහනම්) 'ලෝහශාස්ත්‍ර' නාමය යෙදීමෙනි. චක්‍රපාණි කාලයේත් රසශාස්ත්‍රය බෞද්ධාචාර්යවරයන් අතර පමණක් රහස්‍යගත ව පැවැතුණු බව මෙයින් ද සැලකේ. රසශාස්ත්‍රීය කරුණු මෙන් මැ නාඩීශාස්ත්‍රීය කරුණු ද හොඳින් එළිපැදුම් වූයේ භාරතීය බෞද්ධ බලය අන්තයට ම පිරිහී ගිය 13 වන සියවසේ දීය. මේ නව රස නාඩී කරුණු පුරාතන රාවණ රාජයාට කොයින් ලැබුණේ ද? අර්ක (බේත් අරක්කු) විධානය භාරතයට ලැබුණේ මුසල්මාන යන් ගේ භාරතාක්‍රමණයෙන් පසු ව යි. එක් අවධියෙකැ මුසල්මානයන් ගේ යූනානි වෛද්‍ය ක්‍රමය මුළුමහත් භාරතදේශය පුරා ම පැතිරගත් බව අමතක නොකළ යුත්තකි. අබින්, කංසා, ජයපාල, පෙරුංකායම්, සේනකොළ, ඇපැල් ආදිය ආයුර්වේදයට පිවිසී ඇත්තේ යූනානියේ සම්පර්කයෙනි. සීන අල එක් වූයේ 16 වන සියවසේ දී පරංගීන් ගේ සංක්‍රමණයෙන් පසු ව යි. මේවා කෙළින් ම ඉතිහාසය හා සම්බන්ධ ය. මේ අබින් ආදිය ද අර්කප්‍රකාශයෙහි දක්වෙයි.

තව ද රාවණ ලංකාවත් ශ්‍රී ලංකාවත් එක්කොට සලකන ඇතැම් උගත්තු රාවණ ලංකාව මේ රට යයි හඳුන්වා ලූ හ. අපේ ඉතිහාසය මේ ගැන නිහඬ යැ. ඒ ඇයි? අඩසියවසක් මුළුල්ලේ උත්කලදේශයේ (කලිඟුරටට දකුණින් පිහිටි ඔරිස්සාවේ) පුරාවිද්‍යා අධිකාරිය විශාල මුදලක් වැය කොට ඉමහත් පරිශ්‍රමයෙකින් කළ ගවේෂණයෙක ප්‍රතිඵලය අතට ගෙන පැවසුවේ රාවණ රාජධානිය වූ ලංකාපුරය වින්ධ්‍යපර්වතයේ නැගෙනහිර පෙදෙසේ (ගිරිදුර්ගයේ) පිහිටා තිබුණුබව හා අවට දශදේශයක් ඔහු ගේ රාජ්‍යයට අයත් ව පැවැති බවත් ය. ලංකා යනු 'ඉන්දියා (දේශයේ) කොඳු ඇටය' යන අර්ථය ද, ශ්‍රීලංකා යනු 'ඉන්දියා සාගරයේ යහපත් ඉලක්කය' යන අර්ථය ද ඇසුරු කොට පැන නැඟී තිබෙන බව විචාරක මතය යි. බුදුසමග මේ රටේ ක්‍රියාත්මක වනු සමඟ ම බමුණු ඇදුරන් ගෙන් යති පරපුර අතට පත් වූ අධ්‍යාපන ක්‍රමය අනුව, අසල පිරිවෙනක රාජගුරු හිමිනමක් වෙතින් බුද්ධදාස රජතුමා අවශ්‍ය භාෂා ශාස්ත්‍රාදිය හදාරන්නට ඇතැයි සිතිය හැකි ය. එතුමා ගේ ජීර්ණ වැ ක්ලිෂ්ට වැ නැසීගිය සංස්කෘත සාරාර්ථසංග්‍රහය එහි සිංහල භාවසන්නය ඇසුරින් නොබෝද යළිත් සංස්කෘත පද්‍යයට හැරිගිය අතර එය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණයෙන් ප්‍රකාශයට පමුණුවා තිබීම විශිෂ්ට ශාස්ත්‍රීය සංග්‍රහයක් වශයෙන් සැලකිය හැකි ය. විජයාගමනයට පෙර මෙහි වෙන ම වෛද්‍යක්‍රමයක් පැවැති බවක් ඒ ග්‍රන්ථයෙහි ද නො දක්වෙයි. එහි එනුයේ භාරතීය වෛද්‍ය ඉතිහාසය හා භාරතීය චිකිත්සා විස්තරය යි.

අනුර පොළොන්නරු අවදි දෙක්හි ම පැවැතුණු පිරිවෙන්වල වෛද්‍යාධ්‍යාපනයෙහි මේ ග්‍රන්ථරත්නය යොදාගෙන තිබුණ බව සැලකී යන අතර දඹදෙණි යුගයේ දී පස්මහ පිරිවෙන් පති සඟරජ හිමිතුමන් විසින් මේ ග්‍රන්ථයත්, චරක සුශ්‍රැතාදි වෙනත් වෛද්‍යග්‍රන්ථ හතලිස් ගණනකුත් ඇසුරු කැර භේසජ්ජ මංජුසා නමැති පාලි පද්‍ය ග්‍රන්ථය නිමැවූ බව ප්‍රසිද්ධ ය. මේ ග්‍රන්ථය භික්ෂුවරයින්ගේ ප්‍රයෝජනය සඳහා පිළියෙළ කළ බව ග්‍රන්ථාරම්භයෙහි දක් වේ. මෙහි ස්ත්‍රීරෝග බාලරෝග ප්‍රතීකාර නො එයි. යතිජනයා වෛද්‍යවෘත්තිගත වීම පිළිබඳවත් තමන් එකඟ නොවන බව හැඟවීම පිණිස එසේ කළා විය හැකි ය. මස්මාළු ගුණාගුණ දක්වීමේ දී ගෙරිමස නො දක්වුණේ ගව සමීපතෙහි ගුණය මසෙහි ගුණයට වඩා අගය කළ නිසා වෙන්නට ඇත.

'බ්‍රහ්මන්වයේනනුගතර්ථ — මනෝමදස්සී' (භේ. මං.) යි තමා බ්‍රාහ්මණ වංශයට අයත් ය යි මේ හිමියෝ ම කියාගනිති. මේ වංශය වනාහි බෝධ්‍යාහාර

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

කුලයේ ශාඛා දෙක තුනින් එකකි. මේ විදේශික යතිවරයෙකි යි ඇතැමුන් කියතත්, මෙහි උසස් පස්මහ පිරිවෙන්පති පදවිය පිදීමට පිටරටෙකින් විජාතික හිමිනමක් කැඳවාගනීවි දෑ යි සිතා බැලිය යුතු ය. මේ හිමියන් සිදත් සඟරාව කරන ලදැයි සලකන ඇතැම් උගත්තු ද මුන් වහන්සේ විජාතිකයෙකැයි සලකති. සිදතෙහි මුල්කොටසෙහි එන — 'ගතකුරු ද වේ විස්සෙක් — වහරට යුහු සියබසැ' යන පැදි අඩින් 'සිංහලය සියබසැ' යි කියාගන්නා හිමිනමක් විජාතිකයකු කොට සැලකිය හැකි දෑ යි නොසිති මෙන් එසේ සලකනවා විය හැකි ය. එය වෙන ම කරුණෙකි.

පිරිවෙන් අධ්‍යාපනයෙන් දේශීය වෛද්‍ය ක්‍රමයට ඉටු වී තිබෙන මෙහෙය තව පවත් දික් ගැසේ. දඹදෙණි සමය (13 සියවස) තුළ මයුරප්‍රාසාද පරිවේණ ස්වාමීන් කළ යෝගාර්ණවය හා ප්‍රයෝග – රත්නාවලිය යන දෙක මේ රටේ වෛද්‍යග්‍රන්ථයන් අතර ප්‍රාණිත වෙයි. මෙසෙමෙහි විදුම් පිලිස්සුම්, විදි ද, කැඩුම් බිඳුම්, සර්පවිෂ ඇස්ලෙඩ යන මේවායේ පිළියම් ද ඇතුළත් කුඩා පොත් කිහිපයක් ම පිරිවෙන් ඇසුරින් උගත් වෙදැදුරන් විසින් පිළියෙළ කැර ඇත.

කුරුණෑගල් අවදියේ (14 සියවස) සිද්ධසාරය, වරයෝගසාරය, යෝගසිද්ධිය යන වෙදපොත් ලියැවුණු අතර යූනානි වෛද්‍යක්‍රමයේ ඇතැම් ද්‍රව්‍යවර්ග හා භෛෂජප්‍රකරණ අපේ වෛද්‍ය ක්‍රමයට එකතු වි ය.

ගම්පළ යුගය — ආයුර්වේදයේ භූත විද්‍යා අංශය දියුණුවූ මේ අවධිය තුළ ආන්ධ්‍ර මලල යන (භාරත දක්ෂිණාත්‍ය) දේශීය වෛද්‍යක්‍රම දෙක්හි නොයෙක් ශේද් අපේ වෙදකමට එක් විය.

කෝට්ටේ (16 සියවස) අවදිය සිංහල සාහිත්‍යයේ ස්වර්ණයුගය වශයෙන් සැලකේ. එහි දී සිංහලය පමණක් නො වේ, පෙළ සකු ආදිය ද බැබළිණ. ෂඩ්භාෂාපරමේශ්වර පදවි ලාභයට රහල් සඟරජතුමන් සුදුසු වූ බවද, කවිසිළුමිණටත් වඩා ප්‍රයෝජනවත් බුද්ධදේශනා මහා කාව්‍යයක් ඔබතුමන් අතින් පිළියෙළ වූ බව ද අමතක නොකළ යුතු ය. සාරාර්ථසංග්‍රහය යන නමට අර්ථ විසින් සමීපස්ථ වූ වෛද්‍යක සාරසංක්ෂේපය සාරාර්ථසංග්‍රහය ඇසුරු කැර මොදරගම්මන හිමියන් පැදියෙන් ලියූ සිංහල යෝගරත්නාකරය, ප්‍රයෝග සමුච්චය, (ආන්ධ්‍ර) වෛද්‍යචින්තාමණි සිංහල අනුවාදය යනාදිය පිරිවෙන් අධ්‍යාපනයට ආයුර්වේදය සම්බන්ධ කිරීමේ ප්‍රතිඵලවලින් කිහිපයෙකි.

සීතාවක අවදිය තුළ ධර්මශාස්ත්‍රාලෝකය ක්ෂය වී යෑම ඇරඹිණ. මුල පටන් සකු පෙළ දෙබසේ ද, පසු ව දෙමළ බසේ ද පිහිට ලබාගත් සිංහලයට මේ අවදිය වන විට සමාජ නීතිය පිළිබඳ උපදේශ ග්‍රන්ථයක් පිළියෙළ වී නො තිබුණු බව අලගියවන්න පඬිතුමා ගේ සුභාෂිත කාව්‍යයෙහි එන —

> පහළ පොරණ ඉසිවර මුවෙනි මන — තඳ
> පුව ළ නීතිසත ගත පද අරුත් — ලෙඳ
> දෙමළ සකු මහ දු නොහසළ සතට — දද
> සිහ ළ බසින් සැකෙවින් කියමි පද — බැඳ

පැදියෙන් හෙළි වේ. හොඳින් නුගත් අය භූතයන් බඳු ය. මේ අවධියේ උගත්තු භූත. භූත විද්‍යාව දියුණු වි ය. උණ කටුව ඇනුණු රාජසිංහ රජතුමා මියගියේ වෙදකමක් නො කැර යකැදුරන් මතුරමින් සිටිය දී ය.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

මහනුවර අවදියේ ධර්මශාස්ත්‍ර ප්‍රදීපය නිවී ගියේ ය. රට පරාධීන විය. පිරිවෙන්
ඇසුරින් යම්තම්න් ඇස් පාදගත් අය නිසා වනවාස නිඝණ්ඩුව, යෝග පිටකය, බාලග්‍රහ-
ශාන්තිය, යෝගසාරය, යෝගමාලාව, යෝගදරණය (මේ ඉතා හොඳ වෙදපොතකි)
යෝගමුක්තාවලිය, ගෙඩි වෙදපොත, කැඩුම් බිඳුම් වෙදපොත, අලි වෙද පොත,
ගව වෙද පොත, රජගෙයි ඇස් වෙද පොත, යනාදි කුඩා කුඩා වෙදපොත් රැසක් බිහි
විය. අමුතු ගුළි, කල්ක, තෙල්, රසායන බෙත් ආදි වට්ටෝරු එළිවන්නට පටන් ගති.
එක එක ලෙඩට එක එක වෙද පරපුර බැගින් වෙන් වී යාම ඇරඹුණේ ද මේ අවදි-
යේ ය. මහනුවර යටත් වූ අවස්ථාවේ සුද්දන් ගෙන ගිය පුස්කොළ වෙදපොත් රැසක්
බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ දී දක්නට ලැබුණු බව පුංචිබණ්ඩාර සන්නස්ගල පඬිතුමා
සිය සිංහල සාහිත්‍ය වංශයෙහි ලා සඳහන් කරයි. මහනුවර අවදියේ නිවී ගිය දම්සක්
පහනට සිය නැණ වැටියත්, වැරතෙලත් යොදා යළිත් රට එළි පෙහෙළි කිරීමේ වියපුර
අරඹා වදළ සිරි සරණංකර සඟරජතුමා භේසජ්ජ මංජුසාවට සිංහල සන්නයක් ලියූ
බව ඉතිහාසගතය.

කොළඹ අවදිය — සුද්දන් මෙරට දිනාගත් මුල් අවස්ථාවේ ම අපේ වෙදැදුරු
පිරිස රජයේ සම්බන්ධයෙන් මුදාහැර ඔවුන් වෙනුවට සුදු දොස්තරවරුන් යොදාගත්හ.
වෙදැදුරු පිරිස රටේ අවලංගු කාසි බවට පත් වූහ. එහෙත් ආයුර්වේදය කෙරෙහි
විශ්වාසය තැබූ ජනතාව නිසා ආයුර්වේදය ආරක්ෂා විය. ජාතියේ ආරම්භයේ සිට ම
අපේ සෞඛ්‍යය රැක දෙමින්, පැමිණි ලෙඩ උවදුරු පලවා හරිමින්, දේහබල බුද්ධිබල
ආදිය සලසා දී ජාතික වෛද්‍යක්‍රමය බවට පත් වූ ආයුර්වේදයට යළිත් අරුණාලෝකයේ
පෙරනිමිති පෙනෙන්නට පටන් ගති.

වලානේ සිරි සිදුහත් මාහිමියෝ සිරිසරණකුරු සඟරජ හිමිතුමන් වෙතින් ලබා
ගත් ධර්මශාස්ත්‍ර බීජයන් රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන්හි රෝපණය කළහ.
ඒ බීජවලින් පැනනැඟුණු ධර්මශාස්ත්‍ර නමැති වෘක්ෂලතාවෝ ඉතා හොඳින් පුෂ්පිත ව
වැජඹෙන්නට පටන් ගත්හ. ගිහි පැවිදි පඬිවරුන් ගේ සුලභතාව ඇරඹිණ. භෘංග
ශෝභාවෙන් පැමිණ මේ මල්වල පැණි පානයකැර වදළ හික්කඩුවේ සිරිසුමඟල් හිමියන්
1874 දී විද්‍යෝදය පිරිවෙණ ද සිරි දම්ලෝ හිමියන් 1875 දී විද්‍යාලංකාර පිරිවෙන
පිහිටුවාලීමෙන් ධර්මශාස්ත්‍රාලෝකය අද්භූතාකාරයෙන් පැතිරෙන්නට පටන් ගති
ඒ දෙමහ පිරුවන ඇසුරින් දිවයින පුරා පැන නැඟී සිටි සියගණනක් වූ ශාඛා පිරිවෙන
රාශිය නිසා ඒ තත්ත්වය තව තවත් වැඩි දියුණු විය. ආයුර්වේදාභිලාෂීන් ගේ මනදොළ
පුරවාගැනීමේ අවස්ථාව ද එළඹ ගති. උගත් වෛද්‍යවරු දිවයින පුරා ම ක්‍රියාත්මක වූහ
සහ වෙද ගුරු යන තුන් පිරිස ප්‍රදේශයේ ත්‍රිමූර්තිය වශයෙන් ක්‍රියාත්මක වි
වොරැඳුණ හ. 1902 දී මරදානේ ශ්‍රී ලංකා වෛද්‍ය මහා මණ්ඩලය ඇරඹුණේ විද්‍යෝදය
පිරිවෙණේ අනුශාසනා අනුව යි. ගම්පහ, කළුතර, මහනුවර, කෑගල්ල, රත්නපුර, මීගමුව
අම්බලන්ගොඩ, ගාල්ල, මාතර යනාදී නගරබද ව වෙද සමිති ඇරඹුණේ විදුදය, විදුලක
පිරුවන් දෙකේ ම අනුශාසකත්වය යටතේ ය. මෙබඳු ශාඛා සමිති 104 ක එකීභාව
යෙන් සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනය 1928 දී ඇරඹුණේ ද පිරිවෙන
දෙකේ මඟ පෙන්වීම ඇති ව ය.

මහ පිරිවෙන් දෙකේ ආදි ශිෂ්‍යයන් අතර වූ වෙද පඬිවරු, ආයුර්වේද අධ්‍යාපනය
උපයෝගී වන සංස්කෘත ග්‍රන්ථයන් පදාර්ථව්‍යාඛ්‍යා ලිවීම් විසින් මෙන් ම අනුවා
කිරීම් විසින් ද, සිංහල ග්‍රන්ථයන් සංශෝධනය කිරීම් විසින් ද මුද්‍රණයෙන් ප්‍රකාශන
යට පත් කළ හ.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ආයුර්වේද භාෂාව සංස්කෘතය යි. පිරිවෙන් ඇදුරු හිමිවරු මේ විෂය ද ඉතා හොඳින් හදුරා සිටිති. (සංස්කෘතං නාම දෛවීවාත්) සංස්කෘතයට දේව භාෂාව යයි ද නමකි. දෙවියාට ඕනෑ ම තැනකට ගොස් ඕනෑ ම දෙයක් කළහැකි ය. සංස්කෘතය හදළ අයට අද පවා භාරතය තුළ මේ තත්ත්වය ඇත. ඉන්දියාවේ භාෂා දෙසිය ගණනෙකි. ඒ හැම භාෂාවක් තුළ ම සංස්කෘතය වැජඹෙනුයේ සූපයට සම්බන්ධ වූ ලවණය මෙනි. අපේ භාෂාවේ ද මේ තත්ත්වය පවතී. එහි දුර්වලතාවක් ඇති නම් එයට හේතුව ඉංග්‍රීසිය දේවභාෂා තත්ත්වයෙන් අද වැජඹීම යි.

ලක්වැසියන් සංස්කෘතය උගත්තේ සිංහලයෙනි. සංස්කෘත නිබන්ධයක් සිංහල කිරීම සඳහා සංස්කෘත සිංහල භාෂා දෙකෙහි ම හොඳ අවබෝධයක් ග්‍රන්ථකාරයා තුළ තිබිය යුතු ය. මේ යහපත ද පිරිවෙනින් ඉටු වී ඇත. පිරිවෙණින් සකුව උගත් අය ඇතැම් සිංහල පොත් ද සකුවට නැඟූහ. සිංහල සාහිත්‍යයේ අගය සකුව උගත් පිට රැටියනට අවබෝධ කැරැවීමට යැ.

1929 සිට මෙරටේ ක්‍රියාත්මක වන ප්‍රධාන ආයුර්වේද විද්‍යාල දෙකක් ඇත. මුල් අවස්ථාවල මේ දෙකින් බිහි වූ වෛද්‍යවරයෝ. ආයුර්වේද විෂය හොඳින් තේරුම් ගත් අතර ලේඛක දේශක හේතුවලින් ප්‍රදේශයේ ප්‍රභූත්වයට ද පත් වූහ. මෙහි මූලික හේතුව සිංහල සංස්කෘත භාෂා දෙක අවශ්‍ය ප්‍රමාණයෙන් පිරිවෙන් හි ඉගෙන අනතුරු ව ආයුර්වේද විෂය හැදෑරීම යි.

වෛද්‍ය විද්‍යාලයේ දී සිංහලය ගැන කිසි ම දෙයක් දැනීමට එකතු නො වේ ලැබෙන සකු දැනුම සසඳා තහවුරු කැර ගැනීමට තරම් මනා සිංහල දැනුමක් ඔහුට නැත.

ප්‍රාචීන විභාගයට ආයුර්වේදයත් විෂයක් ලෙස ඇතුළත් කළහොත් වෙද විදුහල්වලට පිවිසීමේ වරය නොලබන දහස් ගණන් සිසු සිසුවියනට ද ආයුර්වේදය හැදෑරීමේ මහ පෑ දෙනු ඇත. එයින් උගත් වෛද්‍ය වරයන් සුලභ වන අතර අඩාළ ව යන ගිහි පැවිදි සම්බන්ධය යළිත් නඟා සිටුවීමට මහ ද පිළියෙළ වනු ඇත.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk